# සුවිශේෂක සාන්ත ලූක් මුනි

## මංගල්‍යය

## පළමුවන දේව ප්‍රකාශනය 2 තිමෝති 4: 9–17

*ශුද්ධ වූ පාවුලු තුමන් විසින් තිමෝතියස් තුමාට ලියන ලද හසුනෙන් උපුටා ගත් කොටසකි.*

"ලූක් පමණක් මා සමග සිටී."

ඉක්මනින් මා වෙත එන්නට උත්සාහ කරන්න. මන්ද, දේමස් ලෞකික ජීවිතයට ඇලුම් වී, මා අත්හැර, තෙසලෝනිකයට ගියේ ය. ක්‍රිස්කේන්ස් ගලාතියටත්, තීතස් දල්මතියාවටත් ගියෝ ය. ලූක් පමණක් මා සමග සිටී. මාක් ඔබ සමග කැඳවාගෙන එන්න. මගේ වැඩට ඔහු ප්‍රයෝජනවත් සහකාරයෙකි. තුකිකස් එපේසියට යැවීමි. ත්‍රෝවස්හි දී කාර්පස් ළඟ මා තබා ආ සළුව ද පොත් ද විශේෂයෙන් සටහන් පොත් ද ඔබ එන විට ගෙනෙන්න.

තඹකරු ඇලෙක්සැන්දර් මට බොහෝ නපුරුකම් පෑවේ ය. සමිඳාණන් වහන්සේ ඔහු කළ දෙයට නිසි විපාක දෙන සේක. ඔබත් ඔහුගෙන් පරිස්සම් වෙන්න. මන්ද, ඔහු අප දුන් පණිවුඩයට දරුණු ලෙස විරුද්ධ වූ බැවිනි.

මගේ පළමු නඩු විභාගයේ දී කිසිවෙක් මා සමග නොසිටියහ. සියල්ලෝම මා අත්හැර ගියෝ ය. ඒ ගැන ඔවුන්ට වරදක් නොපැමිණේ වා. එහෙත් සමිඳාණන් වහන්සේ මා අත්හැර නොගොස් මා ශක්තිමත් කළ සේක. මෙසේ මා මගින් සුබ අස්න සම්පූර්ණ ලෙස සියලු විජාතීන්ට ඇසෙන සේ ප්‍රකාශ වනු ඇත. එසේ සිංහයාගේ කටින් මම මුදා ගනු ලැබුවෙමි.

*දේව වචනය මෙසේ ය.*

## පිළිතුරු ගීය ගීතාවලිය 145: 10-13, 17-18

පිළිතුර : සමිඳුනි, ඔබේ සෙනඟ ඔබේ රාජ්‍යයේ මහිමය වර්ණනා කරති.

ගීය : සමිඳුනි, ඔබ මැවූ සියලු දේ ඔබට තුති පුදයි:
ඔබේ සැදැහැවත්තු ද ඔබට ප්‍රශංසා කරති.
ඔව්හු ඔබේ රාජ්‍යයේ මහිමය වර්ණනා කරති.
ඔබේ බල මහිමය ගැන ද කතා කරති.

එසේ කරන්නේ, දෙවිඳුන්ගේ ප්‍රබල ක්‍රියාත්, රාජ්‍යයේ තේජෝ මහිමයත්
මිනිසුන් හට දන්වන පිණිස ය.
ඔබේ රාජ්‍යය සදාකාලික ය, ඔබේ ආධිපත්‍යය ද
සියලු පරම්පරාවල ම පවත්නේ ය.
සමිඳාණෝ සියලු පොරොන්දු ඉටු කරන සේක.
තමන් කරන සියල්ලේ දී මෙත් සිත් වඩන සේක.

සමිඳාණෝ සැම අතින් ම සාධාරණ ය,
එතුමන්ගේ සියලු ක්‍රියා දයාන්විත ය.
අයදින සියල්ලන්ට සමිඳාණෝ ළං ව සිටින සේක.
අවංක සිතින් යදින්නන්ට ආසන්න ව සිටින සේක.

## සුපුවත් ජය නද ජොහන් 15: 16

ආලේලූයා! ආලේලූයා!
“ඔබ ගොස් බොහෝ පල දරන පිණිසත්,
ඔබේ පල පවතින පිණිසත්, ලෝකයා අතරින් මම ඔබ තෝරා ගතිමි.”
ආලේලූයා!

## සුවිශේෂය ලූක් 10: 1–9

*සුවිශේෂක ලූක් තුමාගේ ශුද්ධ වූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.*

"ගොයම නම් බහුල ය. ගොවීහු විරල ය."

ඉන්පසු සමිඳාණන් වහන්සේ තවත් සැත්තෑ දෙනෙකු පත් කොට තමන් යන්න අදහස් කළ සියලු නගර හා පෙදෙස්වලට ඔවුන් දෙදෙනා බැගින් තමන්ට කලින් යැවූ සේක. උන් වහන්සේ ඔවුන්ට මෙසේ වදාළ සේක: "ගොයම නම් බහුල ය. ගොවීහු විරල ය. එබැවින් ගොයම් කැපීමට මෙහෙකරුවන් එවන මෙන් ගොයමේ හිමියාණන්ට යාච්ඤා කරන්න. ඉතින් යන්න. වගවලසුන් මැදට බැටළු පැටවුන් යවන්නාක් මෙන් මම ඔබ යවමි. පසුම්බියක් හෝ මල්ලක් හෝ පා වහන් හෝ නොගෙන යන්න. මග දී ආචාර කිරීම් සඳහා පමා නොවන්න. ඔබ යම් ගෙදරකට ඇතුළු වූ කල, පළමුකොට 'මේ ගෙදරට සාමය වේ වා!'යි පතන්න. සාමය ලබන්නට සුදුසු කෙනෙක් එහි සිටිත් නම් ඔබගේ සාම පැතුම ඔහු පිට රැඳෙනු ඇත. නැතහොත් එය ඔබ වෙත පෙරළා එනු ඇත. ඔවුන් දෙන දෙය කමින් බොමින් ඒ ගෙදර ම නැවතී සිටින්න. මන්ද, මෙහෙකරුවා සිය වේතනය ලැබිය යුතු ය: ගෙදරින් ගෙදරට නොයන්න. ඔබ යම් නුවරකට ඇතුළු වූ කල ඔවුන් ඔබ පිළිගත්තොත්, ඔබ ඉදිරියෙහි තබන දේ වළඳන්න. එහි සිටින රෝගීන් සුව කරන්න. 'දෙවියන් වහන්සේගේ රාජ්‍යය ඔබ වෙත පැමිණියේ ය'යි ඔවුන්ට ප්‍රකාශ කරන්න.

*සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.*